G.C.E. ORDINARY LEVEL

අ.පො.ස. සාමාන්‍ය පෙළ

STUDENT SEMINAR SERIES


ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව

HISTORY

ඉතිහාසය

ANSWER PAPER

පිළිතුරු පත්‍රය



Powered by

ICT BRANCH Ministry of Education Sri Lanka

NenasaTV

e පාඩම TM The National e-learning Portal for The General Education

අධ්‍යාපන අමාත්‍යාංශය

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශාඛාව

ඉතිහාසය පිළිතුරු පත්‍රය

11 ශ්‍රේණිය

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) පිළිතුරු පත්‍රය

I පත්‍රය

1)	2	15)	1	29)	4
2)	1	16)	4	30)	3
3)	3	17)	2	31)	3
4)	4	18)	4	32)	2
5)	1	19)	1	33)	1
6)	3	20)	3	34)	2
7)	2	21)	4	35)	2
8)	4	22)	3	36)	3
9)	1	23)	3	37)	3
10)	2	24)	2	38)	2
11)	1	25)	3	39)	2
12)	2	26)	4	40)	1
13)	4	27)	2		
14)	2	28)	3		

II පත්‍රය

I කොටස

1.(අ)

A වසභ රජු

B හිරෝහිතෝ අධිරාජ්‍යයා

C චෙංහෝ

D වී.අයි.ලෙනින්

(ලකුණු 1*4 = 4යි)

II. A රූපය

1.පාහියන්ගල

2.කළුතර

3.කැලෑකෙසෙල් / ගෝනල / කටු අල/ කිතුල් ඇට මද / දෝතලු ඇටවල මද / වල්දෙල්

4.පහතරට තෙත් කලාපය

(ලකුණු 1*4 = 4යි)

B රූපය

1.වින්ස්ටන් චර්චිල්

2.බ්‍රිතාන්‍යය

3.එක්සත් ජාතීන්ගේ සංවිධානය

4.මිත්‍ර පාර්ශවය

(ලකුණු 1*4 = 4යි)

II කොටස

2.i . A පැරකුම්බා සිරිත

B රිබෙයිරෝගේ ලංකා ඉතිහාසය / කූටෝගේ වාර්තා

C ෆාහියන් හිමියන්ගේ දේශාටන වාර්තාව / හියුතේසාන් හිමියන්ගේ දේශාටන වාර්තාව

(ලකුණු 1*3 = 3යි)

ii. පාහියන්ගල / බටදොඹලෙන / කිතුල්ගල

(ලකුණු 2*2 = 4යි)

iii. ආහාර රටාව

අවමංගල්‍ය චාරිත්‍ර

ජනගහණය කුඩා කණ්ඩායම් ලෙස සංවිධානය වීම.

(ලකුණු කරුණු වලට 2යි විස්තරයට 3යි)

iv. ලෝහ තාක්ෂණය විස්තර කිරීම.

මැටි බඳුන් නිපදවීමේ තාක්ෂණය

නිවාස ඉදිකිරීමේ තාක්ෂණය

පබළු නිපදවීමේ තාක්ෂණය

(ලකුණු කරුණු වලට 3යි විස්තරයට 3යි)

3.i . A පර්වත රාජ

B නර ඉසෙර

C චක්‍රවර්ති

(ලකුණු 1*3 = 3යි)

ii. A පියාගෙන් පුතාට

- පණ්ඩුකාභය → මුටසිව
- කාවන්තිස්ස → දුටුගැමුණු
- වසභ → වංකනාසිකතිස්ස

B සහෝදරයාගෙන් සහෝදරයාට

- දුටුගැමුණු → සද්ධාතිස්ස
- දේවානම්පියතිස්ස → උත්තිය

(ලකුණු 2*2 = 4යි)

iii. පළාත් බෙදා පරිපාලනය විධිමත් කිරීම

උදා: වල්ලිපුරම් රන් සන්නසේ යාපනය පාලනය කිරීමට සෘෂිගිරි පත් කිරීම.

තම්මැන්නාව හා හැබැස්ස ලිපි අනුව පුතුන් අතර රාජ්‍යය බෙදා තිබීම.

බදු අය කිරීම විධිමත් කිරීම

(ලකුණු කරුණු වලට 2යි විස්තරයට 3යි)

iv. අනුරාධපුරයට වඩා පොළොන්නරුව ආරක්ෂිත ස්ථානයක් වීම.

මහවැලි ගංගාව ආශ්‍රිතව ගංගා නිම්නයේ ආසන්නව පිහිටා තිබීම.

පරිපාලනයේ පහසුව.

(ලකුණු 3+3 = 6යි.)

4.i . A රටක නීති සම්පාදනය කරන ආයතනයකි.

B රටක නීති ක්‍රියාත්මක කරන ආයතනයකි.

C යුක්තිය පසඳලීම.

(ලකුණු 3යි)

ii. A බුද්ධඝෝෂ හිමි

B පළමුවන විජයබාහු / මහා විජයබාහු

C භාතියකාහය

D දැදිගම කොටවෙහෙර / සූතිඝර චෛත්‍යය

(ලකුණු 4යි)

iii. වැව් ඉදි කිරීමේ තාක්ෂණය යටතේ වැවක අංග විස්තර කිරීම.

ඇළ මාර්ග තාක්ෂණය විස්තර කිරීම.

සීගිරියේ ප්ලමල් තාක්ෂණය විස්තර කිරීම.

(ලකුණු 2+3=5යි)

iv. රුවන්වැලිසෑයේ අත්තිවාරම පිළිබඳව විස්තර කිරීම.

ස්වභාවික සම්පත් උපයෝගි කරගෙන නිර්මාණ ඉදිකිරීම.

බුදු පිළිම සමාධි පිළිමය, අවුකන පිළිමය, බෝධිඝර

පිළිම ගෙවල්, විහාර ගෙවල්, ආරාම, දානශාලා, භාවනා කුටි, රාජමාලිගා, බලකොටු, බෙහෙත් ශාලා ආදි ගෘහ නිර්මාණ

රුවන්වැලිසෑය, අභයගිරිය සහ ජේතවනාරාමය ආදි මහා ස්තූප හා ලෝවාමහාපාය ආදි මහල් කිහිපයකින් යුත් ගොඩනැගිලි ඉදිකිරීම.

(ලකුණු 3+3=6)

5.i . යාල්පාන වෛපව මාලෙ

ශේගරාශ ශේකර මාලෙ

කෙලාය මාලෙ

(ලකුණු 3යි)

ii.පළමු නාගරීකරණය අනුරාධපුරය, මාගම, පොළොන්නරුව

දෙවන නාගරීකරණය දඹදෙණිය, යාපහුව, ගම්පොළ, කුරුණෑගල, කෝට්ටේ

(ලකුණු 2*2 = 4යි)

iii. දේශපාලන

ක්‍රි.ව.1247 සිදු වූ චන්ද්‍රබානුගේ පළමු ආක්‍රමණයෙන් රට බේරා ගැනීම.

ක්‍රි.ව.1255 දී කාලිංග මාඝගේ ආක්‍රමණයෙන් රට නිදහස් කර ගැනීම.

ක්‍රි.ව.1261 සිදු වූ චන්ද්‍රබානුගේ දෙවන ආක්‍රමණයෙන් රට බේරා ගැනීම.

සංස්කෘතික

සාහිත්‍ය ග්‍රන්ථ රචනා කිරීම හා අනුග්‍රහය දැක්වීම.

උදා: . කව්සිළුමිණ, විශුද්ධි මාර්ග සන්නස, දඹදෙණි කතිකාවත රචනා කිරීම.

. පූජාවලිය, සද්ධර්මරත්නාවලිය, සිඳත් සගරාව වැනි කෘතීන් සඳහා අනුග්‍රහය

(කරුණු 2 ලකුණු 2 විස්තරයට 3යි)

iv. ස්වයංපෝෂිත කෘෂි ආර්ථික රටාව බිඳවැටී ගෙවතු හා හේන් ආශ්‍රිත ගොවිතැන් ක්‍රමයකට යොමුවීම.

වනාන්තරයේ ඉබේ වැවුණු කුරුදු වෙළෙඳ භෝගයක් බවට පත්වීම.

දේශීය නිෂ්පාදන වල අතිරික්තය අපනයනය සඳහා යොමු වීම.

උදා: පුවක්, ගම්මිරිස්, එනසාල් වැනි භෝග

මුතු, මැණික්, ඇත්දළ, අලිඇතුන් වැනි වෙළෙඳ භාණ්ඩ

විදේශ වෙළෙදාම රජුගේ ඒකාධිකාරය බවට පත්වීම.

උදා: චීනය, අරාබිය, පර්සියාව, ඉන්දියාව, ඊජිප්තුව වැනි රටවල් සමග

(ලකුණු 3+3=6)

6.i . A ලොරෙන්සෝ ද අල්මේදා

B පෝරිස් ෆන් ස්පයිල්බර්ජන්

C ජෝන් ෆයිබස්

(ලකුණු 1*3 = 3යි)

ii. පෘතුගීසින්ගෙන් උඩරටට එල්ලවන ප්‍රහාර මැඩ පවත්වා ගැනීමට සිදු වීම.

පෘතුගීසින් මෙරටින් පළවා හැරීම.

උඩරට රදළ ප්‍රධානීන්ගෙන් එල්ල වූ තර්ජන අවම කර ගැනීම.

ලන්දේසි බලපෑමෙන් උඩරට නිදහස් කර ගැනීම.

(ලකුණු 4යි)

iii. <u>දේශපාලන</u>

ක්‍රි.ව. 1594 දන්තුරේ සටනින් හා 1602 බලන සමගින් පෘතුගීසින් අන්ත පරාජයට පත් කිරීම.

පෘතුගීසින්ට එරෙහිව ඇතිවන පහතරට කැරලි වලට සහයදීම.

උඩරට නව රාජවංශයක් (පේරාදෙණි රජ පෙළපත) ආරම්භ කිරීම හා රාජධානි ස්ථාවරත්වය ඇති කිරීම.

<u>ආගමික</u>

දෙල්ගමු විහාරයේ සගවා තිබූ දන්ත ධාතූන් වහන්සේ මහනුවරට වැඩම කරවා තෙමහල් දළදා මැදුරක් ඉදිකර තැන්පත් කිරීම.

<u>බුරුම දේශයෙන් උපසම්පදාව සඳහා භික්ෂූන් වැඩම කරවා නැවත උපසම්පදාව පිහිටුවීම.</u>

ලංකා තිලකය, රිදී විහාරය, දෙගල්දොරුව, ගඩලාදෙණිය වැනි වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කිරීම.

(ලකුණු 2+3=5යි)

iv. ආර්ථික

ස්වයංපෝෂිත කෘෂි ආර්ථිකයක් පැවතීම.

කදුකර ප්‍රෙද්ශවල හෙල්මලු ක්‍රමයට වී වගා කිරීම.

වැඩි ඉඩම් ප්‍රමාණයක් හේන්වල කුරක්කන්,අමු, මෙනේරි, ඉරිගු වැනි ධාන්‍ය වර්ග හා අල, බතල වගා කිරීම.

ගෙවතු ආශ්‍රිතව කොස්, දෙල්, සාදික්කා, කරදමුංගු, පුවක්, එළවළු හා පළතුරු වගා කිරීම.

අතිරේක ආහාර භෝග මගින් ද ආහාර අවශ්‍යතා සපුරා ගැනීම.

යකඩ, දැව, ලෝහ හා ලාක්ෂා කර්මාන්ත ද පන් කර්මාන්තය ද දියුණුව තිබීම.

සමාජ්

රටේ සියලුම ඉඩම්වල හිමිකම රජතුමා යටතේ පැවතීම.

ඉඩම් අයිතිය හා භුක්තිය පදනම් කරගෙන කොටස් කිහිපයකට බෙදී තිබීම.

- ගබඩා ගම් රජවාසල ප්‍රෙයෝජනයට වෙන් වූ ඉඩම්.
- නින්දගම් රදළ ප්‍රධානීන්ගේ ප්‍රයෝජනයට වෙන් වූ ඉඩම්.
- දේවාල ගම් විහාරාරාම සඳහා වෙන් වූ ඉඩම්.
- පරවේණි ගම් පරම්පරාවෙන් උරුම වූ ඉඩම්

ස්වයංපෝෂිත ග්‍රාමීය සමාජයක් පැවතීම.

සමාජ් සම්බන්ධතා කුල ක්‍රමය මත පදනම් වීම.

අවාහ විවාහ නටයුතු කුලය පදනම් කරගෙන සිදුවීම.

විවාහ ක්‍රම තුනක් පැවතීම.

- දීග විවාහය
- බින්න විවාහය
- එකගෙයි කෑම

සියලු කටයුතු අත්තම් ක්‍රමය යටතේ සිදුවීම.

ගැමි දිවිය හා බැඳුණ ප්‍රධාන මධ්‍යස්ථානය ලෙස පන්සල කටයුතු කිරීම.

(ලකුණු කරුණු 3ට ලකුණු 3, විස්තරයට ලකුණු 3, මුළු ලකුණු 6යි)

7.i. A කෝල්බෘක් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය

B ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය

C සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය

(ලකුණු 1x3 = 3)

ii. ■ පාර්ලිමේන්තු කැඳවීම.

■ වාර අවසන් කිරීම.

■ මංගල පාර්ලිමේන්තුවේ මුලසුන දැරීම.

■ ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ඉදිරිපත් කිරීම.

■ පාර්ලිමේන්තුව විසුරුවා හැරීම.

(ලකුණු 1x4 = 4)

iii. ■ එතෙක් ලංකාව යනුවෙන් හැඳින් වූ මෙරට, ශ්‍රී ලංකාව යන නාමයෙන් හැඳින්වීම.

■ බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය සමග පැවති ව්‍යවස්ථානුකූල බැඳීම් අවසන් කිරීම.

■ ශ්‍රී ලංකාව ඒකීය ජනරජයක් බව පිළිගැනීම.

■ ජනතාවගේ මූලික අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම.

(ලකුණු කරුණුවලට 2යි.විස්තරය 3යි)

iv. ■ වියළි කලාපයේ ගොවි බිම් ඵලදායි ලෙස කෘෂිකාර්මික කටයුතුවලට යොදා ගැනීමට අවශ්‍ය නිත්‍ය ජල පහසුකම් සැපයීම.

■ ඉහළ යන විදුලිබල ඉල්ලුම සඳහා විදුලි බලය නිෂ්පාදනය කිරීම.

■ ජල සම්පාදනය නිසා නව ජනාවාස බිහි කිරීමෙන් ඉඩම් නැති ජනතාවට ඉඩම් සපයා දී ආහාර බෝග වගාව ව්‍යාප්ත කිරීම.

(ලකුණු කරුණුවලට 3යි.විස්තරයට 3යි)

III කොටස

8.i. 1. ප්‍රංශය 5. ඔස්ට්‍රියාව

2. ප්‍රර්මනිය 6. හංගේරියාව

3. ඩෙන්මාර්කය

4. බෙල්ජියම

(ලකුණු 3යි)

ii. A හම්ප්‍රිඩේව් B එඩ්මන්ඩ් කාර්ට්රයිට්

C විලියම් සීමන්ස් D හෙන්රි බෙසමර්

(ලකුණු 4යි)

iii. ■ තේ, රබර්, පොල් වැනි බෝග ආශ්‍රිත කර්මාන්ත සඳහා යන්ත්‍ර සූත්‍ර භාවිතය.
උදාකෝපි කෙටීමේ යන්ත්‍රය, තේ කර්මාන්තය හා රබර් කර්මාන්තය සඳහා යන්ත්‍ර සූත්‍ර භාවිතය.

■ මහා මාර්ග තැනීම (ප්‍රවාහන ක්ෂේත්‍රයේ දියුණුව)

උදා මැකඩම් ක්‍රමය භාවිතය

(ලකුණු 5යි)

iv. <u>ආර්ථික වෙනස්කම්</u>

■ කාර්මික නිෂ්පාදන පුළුල් වීම.

■ වෙළඳ හා වාණිජ කටයුතු පුළුල් වීම.

■ ධනපති පන්තියක් හා වෙළඳ පන්තියක් වර්ධනය වීම.

■ ස්වයංපෝෂිත අර්ථ ක්‍රමය බිඳ වැටීම.

<u>සමාජීය වෙනස්කම්</u>

■ විශාල වශයෙන් රැකියා අවස්ථා බිහිවීම නිසා ජීවන තත්වය උසස් වීම.

■ යුරෝපයේ නගර සංඛ්‍යාව ද, නගරවල විශාලත්වය ද සීඝ්‍රයෙන් වර්ධනය වීම.

■ නගර ඔරොත්තු නොදෙන තරමට ජනාකීර්ණ වීම.

■ ග්‍රාමීය ජනතාව නගර කරා ඇදී ඒම.

■ පන්ති සහිත සමාජයක් බිහි වීම.

■ ඉඩම්හිමි ධනවතුන් බිහි වීම.

■ මධ්‍යම පන්තික ව්‍යාපාර හිමියන් , කර්මාන්තහිමියන් , බැංකුකරුවන් , කොන්ත්‍රාත්කරුවන්, ඉංජිනේරුවන්,නීතිඥයින් වැනි පිරිසක් බිහි වීම.

(එක් වර්ගයකින් එක් කොටසක්වත් ලියා තිබීම අත්‍යවශ්‍යයි. ලකුණු 3x2 = 6)

9. i. A ඔටෝ වොන් බිස්මාක්

B ලුසිටානියා නැවට පහර දීම

C මහ ලේකම්

(ලකුණු 1x3 = 3)

ii.A බ්‍රිතාන්‍යය , ප්‍රංශය B ජර්මනිය , ජපානය

(ලකුණු 2x2 = 4)

iii. ■ දෙවන ලෝක මහා සංග්‍රාමයෙන් ජර්මනිය අයත් වූ ආරක්ෂ පිලට පරාජය අත් වීම.

■ මිනිස් ජීවිත මිලියන 50 ට වඩා විනාශ වීම.

■ දේපල හා ධනය විනාශ වීම.

■ නාසි හමුදා කඳවුරු වලදී යුදෙව්වන් විශාල වශයෙන් ඝාතනය වීම.

■ ප්‍රංශ හා බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයන් බිඳ වැටීම.

■ ලංකාව, ඉන්දියාව, චීනය වැනි රටවල් නිදහස ලැබීම.

■ මාර්ෂල් සැලැස්ම හරහා පරාජිත රටවල් නගා සිටුවීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

■ ඇමරිකා එක්සත් ජනපදය හා රුසියාව ලෝක බලවතුන් ලෙස නැගී සිටීම.

■ සමාජවාදී හා ධනවාදී බල කඳවුරු බිහි වීම.

(ලකුණු 2+3=5)

iv. ■ ආර්ථික සම්පාදක පැනවීම.

■ සාමසාධක හමුදා යෙදවීම.

■ න්‍යෂ්ටික අවි තැනීම සීමා කිරීම හා පාලනය කිරීම සඳහා කටයුතු කිරීම.

(කරුණු 3ට ලකුණු 3යි. විස්තරයට ලකුණු 2යි.)